ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2039/31 - 2017 ඔක්තෝබර් මස 06 වැනි සිකුරාදා - 2017.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 7/2001

### 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත

1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වන වගන්තිය යටතේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**තිලක් මාරපන,**
විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2017 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2017 එක්සත් ජාතීන්ගේ (න්‍යෂ්ටික, රසායනික හෝ ජීව විද්‍යාත්මක අවි ව්‍යාප්තියට අදාළ සම්බාධක) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

2. න්‍යෂ්ටික, රසායනික සහ ජීව විද්‍යාත්මක අවි ව්‍යාප්තිය වැළැක්වීම සඳහා වූ පුළුල් අවශ්‍යතා සමූහයක් නිශ්චිතව දක්වනු ලබන්නා වූ ද, යම් සාමාජික රාජ්‍යයක නීත්‍යානුකූල බලයක් නොමැතිව ක්‍රියාකරන යම් ස්වභාවික හෝ නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ ආස්ථිත්‍යයක් විසින් න්‍යෂ්ටික, රසායනික හෝ ජීව විද්‍යාත්මක අවි සහ ඒවා යැවීමේ උපක්‍රම නිෂ්පාදනය කිරීම, අත්පත් කර ගැනීම, සන්තකයේ තබා ගැනීම, වැඩිදියුණු කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම, භාවිත කිරීම මෙන්ම ඉහත සඳහන් ක්‍රියාකාරකම්වලින් යම් කිසිවක නිරත වීමට තැත් කිරීම, අපසහායකයකු ලෙස එම ක්‍රියාකාරකම්වලට සහභාගී වීම, සහාය වීම හෝ මුදල් සැපයීම තහනම් කිරීම සඳහා උචිත වන්නා වූ නෛතික ක්‍රියාමාර්ග ගන්නා ලෙස, 1540(2004) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතිය මගින් සහ ඒ යෝජනා සම්මුතියට පසුව ගෙන එන ලද යෝජනා සම්මුති වන 1673(2006), 1810(2008), 1977(2011), 2055(2012) සහ 2325(2016) දරන යෝජනා සම්මුති ද ඇතුළුව පසුව ගෙන එන ලද වෙනත් යම් යෝජනා සම්මුතියක් මගින් කරන ලද වෙනස් කිරීම් සහ සවිමත් කිරීම් මගින් එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් මත බැඳීම් සමූහයක් පනවනු ලැබේ. තව ද, අදාළ ද්‍රව්‍ය මත උචිත පාලනයක් ඇති කිරීම ඇතුළුව මෙකී අවි සහ යැවීමේ උපක්‍රම ව්‍යාප්තිය වැළැක්වීම සඳහා ගෘහස්ථ පාලනයක් ස්ථාපිත කරන ලෙස සාමාජික රාජ්‍යයන්ට නියම කරනු ලැබේ. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ VII වන පරිච්ඡේදය යටතේ ක්‍රියා කරමින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාව විසින් 2004 අප්‍රේල් මස 28 වන දින 1540(2004) දරන යෝජනා සම්මුතිය ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

3. (1) ශ්‍රී ලංකාව තුළ න්‍යෂ්ටික, රසායනික හෝ ජීව විද්‍යාත්මක අවි සහ ඒවා යැවීමේ උපක්‍රම නිෂ්පාදනය කරන, අත්පත් කර ගන්නා, සන්තකයේ තබාගන්නා, වැඩිදියුණු කරන, ප්‍රවාහනය කරන, මාරු කරන හෝ භාවිත කරන යම් තැනැත්තකු හෝ කණ්ඩායමක් හෝ ආස්ථිත්‍යයක් මෙම නියෝග යටතේ වරදක් සිදු කරනු ලබන අතර මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී වසර විස්සකට නොවැඩි කාලසීමාවක් සඳහා වූ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධානාගාරගත කිරීමකට හෝ මිලියන පහකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) න්‍යෂ්ටික, රසායනික හෝ ජීව විද්‍යාත්මක අවි සහ ඒවා යැවීමේ උපක්‍රම නිෂ්පාදනය කිරීමේ දී, අත්පත් කර ගැනීමේ දී, සන්තකයේ තබාගැනීමේ දී, වැඩිදියුණු කිරීමේ දී, ප්‍රවාහනය කිරීමේ දී, මාරු කිරීමේ දී හෝ භාවිත කිරීමේ දී අපසහායකු ලෙස සහභාගි වන, සහාය වන හෝ මුදල් සපයන යම් තැනැත්තකු හෝ කණ්ඩායමක් හෝ ආස්ථිත්‍යයක් මේ නියෝග යටතේ වරදක් සිදු කරනු ලබන අතර මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී වසර පහකට නොවැඩි කාලසීමාවක් සඳහා වූ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධානාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

4. (1) යම් තැනැත්තකු විසින්, න්‍යෂ්ටික, රසායනික හෝ ජීව විද්‍යාත්මක අවි සහ ඒවා යැවීමේ උපක්‍රම නිෂ්පාදනය කිරීම, අත්පත් කර ගැනීම, සන්තකයේ තබා ගැනීම, වැඩිදියුණු කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හෝ භාවිත කිරීම සඳහා හෝ එවැනි න්‍යෂ්ටික, රසායනික හෝ ජීව විද්‍යාත්මක අවි හා සම්බන්ධිත ද්‍රව්‍ය ව්‍යාප්ත කිරීමේ කාර්ය සඳහා, යම් අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම්, සහ ආර්ථික සම්පත් සහ මූල්‍ය හෝ වෙනත් අදාළ සේවා යම් තැනැත්තකුට, කණ්ඩායමකට හෝ ආස්ථිත්‍යයකට ඍජුව හෝ වක්‍රව ලබා දීම හෝ එවන් තැනැත්තකුගේ, කණ්ඩායමක හෝ ආස්ථිත්‍යයක ප්‍රතිලාභය සඳහා ලබා දීම සිදු නොකළ යුතු ය.

(2) (1) වන ඡේදය උල්ලංඝනය කරන්නා වූ යම් තැනැත්තකු හෝ කණ්ඩායමක් හෝ ආස්ථිත්‍යයක් මේ නියෝග යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහාධිකරණය මගින් වරදකරු කරනු ලැබීමේ දී වසර පහකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

5. (1) සාමකාමී කාර්යයන් වෙනුවෙන් න්‍යෂ්ටික, රසායනික සහ ජීව විද්‍යාත්මක අවි ආශ්‍රිත ද්‍රව්‍ය සමග කටයුතු කරන යම් තැනැත්තකු, අදාළ ලිඛිත නීතියකට අනුකූලව, නිෂ්පාදනයේ දී, භාවිතයේ දී, ගබඩා කිරීමේ දී සහ ප්‍රවාහනයේ දී අවම වගවීමේ සහ සුරක්ෂිත කිරීමේ ක්‍රමවේදවලට සහ අවම භෞතික ආරක්ෂණ ක්‍රමවේදවලට අනුකූලව කටයුතු කිරීම සහ ඒවා පවත්වාගෙන යාම සිදු කළ යුතු ය.

(2) (1) වන ඡේදය උල්ලංඝනය කරන්නා වූ යම් තැනැත්තකු හෝ කණ්ඩායමක් හෝ ආස්ථිත්‍යයක් වරදකට වරදකරු විය යුතු අතර මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී වසර පහකට නොවැඩි කාලසීමාවක් සඳහා වූ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

6. (1) සාමකාමී කාර්යයන් සඳහා ශ්‍රී ලංකාව තුළ න්‍යෂ්ටික, රසායනික සහ ජීව විද්‍යාත්මක අවි ආශ්‍රිත ද්‍රව්‍ය අපනයනය කිරීමෙහි, සංක්‍රමණය කිරීමෙහි, නැව්වලට මාරු කිරීමෙහි හෝ ප්‍රති-අපනයනය කිරීමෙහි නිරත වන යම් තැනැත්තකු හෝ කණ්ඩායමක් හෝ ආස්ථිත්‍යයක් විසින් අදාළ ලිඛිත නීතියට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(2) (1) වන ඡේදය උල්ලංඝනය කරන යම් තැනැත්තකු හෝ කණ්ඩායමක් හෝ ආස්ථිත්‍යයක් මේ නියෝග යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී වසර පහකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

7. මේ නියෝගවල කාර්යය සඳහා, ආරක්ෂක විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නිසි බලධරයකු සිටිය යුතු ය.

8. (1) මේ නියෝගවල යම් ප්‍රතිපාදනයක් උල්ලංඝනය කිරීමට හෝ උල්ලංඝනය විය හැකි බවට අදාළ වන යම් කාරණයක් හෝ තොරතුරක් නිසි බලධරයා, යම් ආයතනයක්, මූල්‍ය බුද්ධි ඒකකය සහ අමාත්‍යවරයා විසින්, උචිත නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතන වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(2) නිසි බලධරයා විසින් නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතන, අදාළ ආයතන, මූල්‍ය බුද්ධි ඒකකය සහ වෙනත් උචිත නියෝජ්‍යායතන විමසා මේ නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීම සහ නියෝග බලාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු සැලැස්මක් නිර්මාණය කළ යුතු ය.

(3) නිසි බලධරයා විසින්, මේ නියෝග යටතේ වූ ව්‍යවහාර ක්‍රියාත්මක කිරීම සඳහා සහ බැඳීම් බලාත්මක කිරීම සඳහා විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

9. මේ නියෝගවල කාර්යය සඳහා -

"ජීව විද්‍යාත්මක අවි" යන්නෙන් ක්ෂුද්‍ර ජෛවීය හෝ ජීව විද්‍යාත්මක යුද වැදීමේ ද්‍රව්‍යයක අඩංගු ආසාදනය වීමේ හෝ විෂ සහිත වීමේ ගති ලක්ෂණවල බලපෑම් මගින් මිනිසුන්, සතුන් හෝ ශාක මරා දැමීම, පීඩා කිරීම හෝ ආසාදනය කිරීම සඳහා නිර්මාණය කරන ලද අවි අදහස් වේ;

"රසායනික අවි" යන්නෙන්,

*(අ)* මේ නියෝග යටතේ තහනම් කරනු නොලැබූ සාමකාමී කාර්ය සඳහා අදහස් කරනු ලබන අවස්ථාවල දී හැර එම කාර්ය සඳහා වර්ග සහ ප්‍රමාණ අනුකූල වන තාක් දුරට විෂ සහිත රසායනික ද්‍රව්‍ය සහ ඒවායේ පූර්වගයන්;

*(ආ)* යුද උපකරණ සහ උපක්‍රම සේවයේ නියුක්ත කරවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මුදා හැරිය හැකි වන්නා වූ (අ) ඡේදයේ නිශ්චිතව සඳහන් කරන ලද විෂ සහිත රසායනික ද්‍රව්‍යවල විෂ සහිත ගති ලක්ෂණ මගින් මරණය හෝ වෙනත් හානියක් සිදු කිරීමට විශේෂයෙන් නිර්මාණය කර ඇති යුද උපකරණ සහ උපකරණ;

*(ඇ)* (ආ) ඡේදයේ නිශ්චිතව සඳහන් කරන ලද යුද උපකරණ සහ උපකරණ සේවයේ නියුක්ත කිරීමට අදාළව සෘජුවම භාවිත කිරීම සඳහා නිශ්චිතව නම් කරනු ලැබී ඇති යම් උපකරණයක්;

"ආස්ථිත්‍යය" යන්නෙන්, සංස්ථාපිත මණ්ඩලයක්, භාරයක්, හවුල් ව්‍යාපාරයක්, අරමුදලක්, සංස්ථාපිත නොවන සංගමයක් හෝ සංවිධානයක් අදහස් වේ;

"මූල්‍ය බුද්ධි ඒකකය" යන්නෙන්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකය අදහස් වේ;

"මහාධිකරණය" යන්නෙන්, කොළඹ දී පැවැත්වෙන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාත සඳහා වූ මහාධිකරණය අදහස් වේ;

"යැවීමේ උපක්‍රම" යන්නෙන්, න්‍යෂ්ටික, රසායනික හෝ ජීවවිද්‍යාත්මක අවි යැවීමේ ශක්‍යතාවයක් සහිත වූත් එවැනි භාවිතයන් සඳහා විශේෂයෙන් නිර්මාණය කරන ලද්දා වූත් මිසයිල, රොකට් සහ මිනිසුන් රහිත පද්ධති අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, විදේශ කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"න්‍යෂ්ටික අවි" යන්නෙන් ස්වයංධාරිතාවය සහිත න්‍යෂ්ටික විඛණ්ඩනයක් සහ/ හෝ විලයනයක් මගින් සිදුවන හදිසි ශක්තිය මුදා හැරීමක් හේතුවෙන් පිටවන ශක්තිය මගින් පිපිරවීමක් සහ දැවැන්ත හානියක් සහ විනාශයක් නිපදවීමේ හැකියාව ඇති අවි එකලස් කිරීමක් අදහස් වේ;

"තැනැත්තා" යන්නට, (2 වන අධිකාරය වූ) අර්ථ නිරූපණ ආඥාපනතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"සම්බන්ධිත ද්‍රව්‍ය" යන්නෙන්, අදාළ බහු පාර්ශ්වීය ගිවිසුම් සහ වැඩපිළිවෙලවල් මගින් ආවරණය වන්නා වූ හෝ න්‍යෂ්ටික, රසායනික සහ ජීව විද්‍යාත්මක අවි සහ ඒවා යැවීමේ උපක්‍රම නිර්මාණය කිරීම, වැඩිදියුණු කිරීම, නිෂ්පාදනය කිරීම හෝ භාවිතා කිරීම සඳහා භාවිත කරනු ලැබිය හැකි ජාතික පාලන ලැයිස්තුවල ඇතුළත්ව ඇති ද්‍රව්‍ය, උපකරණ සහ තාක්ෂණය අදහස් වේ;

"නැව්වලට මාරු කිරීම" යන්නෙන් ශ්‍රී ලංකාවේ වරායන් තුළින් නැව්ගත කිරීම අදහස් වේ.

10-629

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.